**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

**සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය**
**சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE**

මගේ අංකය / எனது இல / My No: **DDD/HO/07/SD/05/01/SK**

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: **2017.03.31**

සියලුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>සමෘද්ධි කැකුළු ළමා සමාජ ප්‍රතිසංවිධානය කිරීම - 2017</u>**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යටතේ 2004 වසරේ සිට දිවයින පුරා ආරම්භ කරන ලද සමෘද්ධි කැකුළු ළමා සමාජ හරහා දරුවන්ගේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන් වර්ධනය කිරීමටත් එකිනෙකාට ගරුකරන, සමබර පෞරුෂයකින් හෙබි සංවේදී දරු පරපුරක් සමාජයට දායාද කිරීම සඳහාත් ලද පිටිවහල ඉමහත්ය.

02. ඒ අනුව දිවයින පුරා පිහිටුවා ඇති සමෘද්ධි කැකුළු ළමා සමාජ ප්‍රතිසංවිධානය කරමින් සක්‍රියව පවත්වා ගැනීම හා නිරන්තරව යාවත්කාලීනවන දත්ත පද්ධතියක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව පැන නැගී ඇති අතර, රාජ්‍ය දෙපාර්තමේන්තු හා බාහිර ආයතන සම්බන්ධ කර ගනිමින් විවිධ වැඩසටහන් ළමා සමාජ හරහා ක්‍රියාත්මක කිරීමට අවකාශය ලැබී ඇත. එබැවින් 2017 මැයි 15 වන විට ඔබ දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මකව පවතින ළමා සමාජ ප්‍රතිසංවිධානය සඳහා කටයුතු කළ යුතුය.

03. ඇමුණුම් අංක 01 අනුව ඔබ වෙත යොමුකර ඇති සමෘද්ධි කැකුළු ළමා සමාජ ව්‍යවස්ථාව ප්‍රකාරව සියළුම ළමා සමාජ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමෘද්ධි මහ සංගමයේ සමෘද්ධි කැකුළු ළමා සමාජ නමින් ලියා පදිංචි කළ යුතුය. ළමා සමාජ සාමාජිකත්ව අයදුම්පත් ආකෘතිය ඇමුණුම් අංක 02 හි දැක්වේ. ළමා සමාජ ප්‍රතිසංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු.20,000/- බැගින් වන පරිදි දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramulla**

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail- dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්)
பணிப்பாளர் ( மனிதவளம்)
Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
**Hot Line : 0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி )
Director ( Micro Finance)
011-2889003
011-2887469
**Hot Line:0112-885582**

කාර්යාලය
அலுவலகம்
Office
011-2887280
**Hot Line: 011- 2887722**

04. ඇමුණුම අංක 02 ආකෘතිය අනුව ළමා සමාජ ලියාපදිංචි නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වාගෙන යා යුතු අතර එම තොරතුරු ඇමුණුම් අංක 03 ආකෘතිය අනුව දිස්ත්‍රික් කාර්යාලය හරහා ජුනි මස 05 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුය. ළමා සමාජ සාමාජික සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු මෙන්ම සක්‍රිය ළමා සමාජ පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා මාස 06 කට වරක්වත් මෙම තොරතුරු යාවත්කාලීන කළ යුතුය. (මේ සඳහා email- socialdev@divineguma.gov.lk භාවිතා කළ හැක.)

05. ඉහත සඳහන් කාල සීමාව තුළ කැකුළු ළමා සමාජ ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කරන ලෙසත්, හැකි සෑම අවස්ථාවලදීම ළමා හිමිකම් හා අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන අනිකුත් ආයතන හා රාජ්‍ය නිළධාරින් සම්බන්ධ කරගනිමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා දරුවන් ඒකරාශි කර ගැනීමට නිර්මාණශීලිව සමාජ සංවර්ධනය හා පරිසරය සුරක්ෂිත කිරීම උදෙසා වැඩසටහන් සංවිධානය කරන ලෙසත් දන්වමි.

06. 2017 වසරේ සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලියට අදාළ උපදෙස් පත්‍රිකාව නුදුරු දිනකදී ලබා දීමට කටයුතු කරන බවද කාරුණිකව දන්වන අතර මේ සඳහා ඔබ සහ ඔබ කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - 1. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කරු.ද.ගැ.ස.

2. ලේකම්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය - කරු.ද.ගැ.ස.

3. සියලුම බැංකු කලාප කළමනාකරුවන් - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

4. සියලුම මහා සංගම් කළමනාකරුවන් - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස

5. සියලුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.